# පූර්ණකාලීන වැඩිහිටි අධ්‍යාපන වැඩපිළිවෙලක් හා සේවා වියුක්තියට පිළියමක් ලෙස 1978 පිහිට වූ කාර්මික අධ්‍යාපන ඒකක පිළිබඳ ඇගයීමක්.

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත්කරන
නිබන්ධනය.

කර්තෘ
පී. සමරසේකර

සාමාන්‍ය ශාස්ත්‍රවේදී, අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

UCLIB
414654
CR

1987

UNIVERSITY OF ... LIBRARY

## සංක්ෂේපයෙන්....

පූර්ණකාලීන වැඩිහිටි අධ්‍යාපන වැඩපිළිවෙලක් හා සේවා විශුක්තියට පිළියමක් ලෙස 1978 පිහිටුවන ලද කාර්මික අධ්‍යාපන ඒකක පිළිබඳ, විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය භාවිතා කරමින් ඇගයීමක් කිරීම, මෙම අධ්‍යයනයේ පරමාර්ථයයි.

ශ්‍රී ලංකාවේ පාසැල් හැරයන්නවුන්ගේ ගැටළුව අධ්‍යයන ගැටළු අතර ඉතා වැදගත් තැනක් ගනී. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සම්බන්ධයෙන් සලකා බැලුවද පාසල් හැරයන්නවුන් බලවත් ගැටළුවකි. මෙම පාසැල් හැරගිය ප්‍රජාව කිසියම් වෘත්තියකට යොමුකිරීම සම්බන්ධයෙන් ඇති ප්‍රධාන ගැටළුව නම් ඔවුහු යෝග්‍ය වෘත්තීය පුහුණුවක් ලබා නොතිබීමය.

පාසැල් හැරයන්නවුන්ගේ අවශ්‍යතා ඉටුකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නොයෙකුත් අධ්‍යාපනික කාර්යයන් අරඹා ඇත. මෙම අධ්‍යාපනික කාර්යයන් අතර වෘත්තීය පුහුණුවක් ලබාදීමේ අපේක්ෂාව පෙරදැරි කරගෙන, පාසල් හැරගිය තරුණ ප්‍රජාව වෙනුවෙන් පූර්ණ කාලීන කාර්මික අධ්‍යාපන ඒකක අරඹා ඇත.

වැඩිහිටි අධ්‍යාපන වැඩ පිළිවෙලක් ලෙස සහ සේවා විශුක්තියට පිළියමක් ලෙස මෙම වැඩ පිළිවෙල කෙතෙක් දුරට සාර්ථක වී තිබේද? යන්න ඇගයීම මෙම කෘතියේ අපේක්ෂාවය.

මෙම පර්යේෂණය සඳහා කෑගල්ල සහ ගම්පහ යන දිස්ත්‍රික්ක දෙකෙහි, කාර්මික අධ්‍යාපන ඒකක හයක පුහුණුව ලැබුවන් 260 ක් නියැදිය ලෙස තෝරාගෙන ඇත. ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ විවිධ ලේඛන සමීක්ෂණය තුලින් දත්ත රැස්කර ගන්නා ලදී.

කාර්මික අධ්‍යාපන ඒකක වල පුහුණුව ලැබුවන් සියලුම දෙනා තරුණ තරුණියන්ය. මෙම තරුණ තරුණියන්ගෙන් සියයට පනහකට වැඩි පිරිසක් අවුරුදු 20 – 30 අතර වයස් පරාසය නියෝජනය කර ඇත. මෙම තරුණන් කාර්මික

අධ්‍යාපන ඒකක තුල පුහුණුව ලැබීමට වැඩිපුරම පෙළඹී ඇත්තේ, කිසියම් රැකියාවක නියැලීමට අවශ්‍ය මූලික සුදුසුකම් ලබා ගැනීමටය.

මෙම තරුණ තරුණියන් මාස හයක කාලයක් තුල දිනකට පැය තුන බැගින් පැය තුන්සිය හැටක කාලයක් තුල අපේක්ෂිත පුහුණුව අවසන් කළ යුතු විය. මෙම අධ්‍යයනයේදී පැහැදිලි වූයේ අභ්‍යාසලාභීන්ට සිය දක්ෂතා ප්‍රමාණවත් ලෙස දියුණු කර ගැනීමට අදාල කාල ඡේදය ප්‍රමාණවත් නොවන බවය. එහෙත් අළුත් වෘත්තියමය දක්ෂතා අභ්‍යාසලාභීන් තුල ඇතිකිරීමට මෙම පුහුණුව සමත් වී ඇත.

කාර්මික අධ්‍යාපන ඒකක අභ්‍යාසලාභීන් තුල වෘත්තීයමය දක්ෂතා දියුණු කිරීම කෙරෙහි පමණක් අවධාරණය යොමුකර ඇති අතර, වැඩිහිටියන් පුහුණු කිරීම සඳහා යොදාගෙන ඇති අවස්ථාවක් වශයෙන්, ඔවුන්ගේ ජීවිත දක්ෂතා දියුණු කිරීම කෙරෙහි සැලකිල්ල යොමුකර නැත. එමෙන්ම ඌන පූරණ සාමාන්‍ය අධ්‍යාපනය කෙරෙහිද සැලකිල්ල දක්වා නැති බව පැහැදිලි විය.

මෙම පාඨමාලාවන්හි අන්තර්ගත විෂය කරුණු ගැන සලකා බලන විට පෙනී යන්නේ උසස් වෘත්තිය දක්ෂතා ලබා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි, විෂය කරුණු සියළුම පාඨමාලාවල අන්තර්ගත නොවන බවය. පුහුණුව ලැබූවන්ගෙන් අඩකට පමණ පාඨමාලාවල අන්තර්ගත විෂය කරුණු අපේක්ෂිත දක්ෂතා ලබාගැනීමට ප්‍රමාණවත් වී නැත.

කාර්මික අධ්‍යාපන ඒකක වැඩ පිළිවෙල වැඩිහිටි අධ්‍යාපන වැඩපිළිවෙලක් ලෙස සලකා බැලීමේදී පෙනීයන්නේ, ප්‍රජාතන්ත්‍රීය බව දක්නට ලැබුණු බවය. එහෙත් නිශ්චිත වූ කාල සටහනක් අනුව නියම කරනු ලැබූ පාඨමාලාවක පුහුණුව ලබන්නට සිදුවීම නිසා වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයක තිබිය යුතු නම්‍යය බව මෙම වැඩ පිළිවෙල තුල නොතිබූ බව කිව හැකිය. අඛණ්ඩව ඉගෙනුමට කැමැත්ත දක්වන සිසුන්ට ඒ සඳහා අවස්ථාව සලසා තිබූ බව නොපෙනේ.

මෙවැනි වැඩිහිටි පුහුණු වැඩපිළිවෙලක් තුලින්, අභ්‍යාසලාභීන්ගේ ජීවිතයේ ගුණාත්මක බව වැඩිකිරීම නැතහොත් දිගුකාලීන, අවශ්‍යතා ඉටුකරගැනීම කළහැකිව තිබුනි. පාසැලේදී ඉගෙන ගත නොහැකි වූ දේ පාසැලෙන් පසු, මෙවැනි වැඩිහිටි

අධ්‍යාපන වැඩ පිළිවෙලක් තුළින් ලබාදීමේ හැකියාව තිබුණද එවැනි ප්‍රයෝජනයක් අත්පත් කරගත් බව පෙනෙන්නට නැත. ප්‍රායෝගික ජීවිතය සඳහා දැනුම උපයෝගී කරගැනීම හා පුවත්වීම තුළින් ඉගෙනීමට අවස්ථාව සලසාදීම, කාලානුරූපව අවශ්‍ය වන දැනුම හා ආකල්ප ලබාදීම මෙවැනි වැඩ පිළිවෙලක් තුළින් මුදුන්පත් කර ගැනීමට හැකියාව තිබුණි. එහෙත් පාසැලේදී ඇතිවූ ඌනතා, පූරණය කර ගැනීමට තිබූ කදිම අවස්ථාවත් මගහැරීගොස් ඇත.

සේවා නියුක්ති තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී පෙනී යන්නේ, සැලසුම්කරුවන් අපේක්ෂා කර ඇත්තේ, පුහුණුවෙන් පසුව ස්වයං රැකියාවක හෝ වෙනත් රැකියාවක නියැලෙනැයි යන්නය. ස්වයං රැකියාවක නියැලීමට පුහුණුව ලැබූ සියල්ලන්ම කැමැත්ත දක්වා නැත. ස්වයං රැකියාවක නියැලීමට අවශ්‍යවන මූල ධනය මෙම දිළිඳු තරුණන්ට නොතිබීම, ස්වයං වෘත්තියකට නොපෙළඹවීම කෙරෙහි බලපා ඇත. රජයේ හෝ සංස්ථා රැකියා ලබාගැනීම කෙරෙහි ඔවුන්ගේ වැඩි කැමැත්තක් තිබී ඇත. මෙම පුහුණුව තුළින් ලබාගත් දක්ෂතා පදනම් කරගෙන රැකියා මාර්ගයකට අවතීර්ණවීමට ඉඩ ප්‍රස්ථාව, පුහුණු වූවන්ගෙන් සියයට 43 කට ලැබී ඇත.

පුහුණු ශිල්පීය ක්‍රම පිළිබඳව සලකා බැලීමේදී පෙනීයන්නේ උපදේශකවරු වැඩිහිටි ඉගැන්වීම් ශිල්පීය ක්‍රම හොඳින් දැන නොසිටියද, සාර්ථක ලෙස සිය කාර්යය ඉටු කළ බවය. ශිෂ්‍ය කේන්ද්‍රීය බව දක්නට ලැබුන අතර ක්‍රියාකාරකම්වලට වැදගත් තැනක් ලැබුණි. උපදේශකවරයා හා අභ්‍යාසලාභියා අතර මිත්‍රශීලී වාතාවරණයක් තිබුණි.

සමස්තයක් වශයෙන් සලකා බලන කල පාසල් හැරගිය තරුණන්ගේ වෘත්තීයමය ගැටළු සම්පූර්ණයෙන් නිරාකරණය කරලීමට මෙම වැඩ පිළිවෙල සමත් නොවූවද, යම් යම් වෘත්තීන් පිළිබඳ පදනම් පුහුණුවක් ලබාදීමට මෙම කාර්මික අධ්‍යාපන ඒකක සමත් වී ඇත. වැඩිහිටි අධ්‍යාපන වැඩ පිළිවෙලක් ලෙස සලකා බැලීමේදී පෙනීයන්නේ, කාර්ය බද්ධ දක්ෂතා හා ජීවිත දක්ෂතා මීට වඩා ඵලදායි ලෙස, තරුණ තරුණියන් තුළ ගොඩනැගීම සඳහා මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගතහැකිව තිබුණු බවය.

මෙම ශූ කාර්මික අධ්‍යාපන ඒකකයන්වලින් අපේක්ෂිත නිෂ්ඨාව කරා වඩාත් සාර්ථක හා ඵලදායි ලෙස ගමන් කිරීමට ප්‍රයෝජනවත් විය හැකි යෝජනා කීපයක් ද මෙහිලා ඉදිරිපත් කර ඇත.